සියලු ම හිමිකම් ඇවිරිණි
All Rights Reserved]

# අධ්‍යාපන පොදු සහතික පත්‍ර උසස් පෙළ විභාගය
## ගම්පහ අධ්‍යාපන කලාපය
## Gampaha Education Zone

කලාපය Gampaha Education Zone ගම්පහ අධ්‍යාපන කලාපය Gampaha Education Zone

දෙවන වාර ඇගයීම - 2025
Second Term Evaluation - 2025

25 B I

ශ්‍රේණිය Grade } 12 | විෂයය Subject } යුරෝපා ඉතිහාසය I | කාලය Time } පැය 03 මි. 10 යි

නම : - ........................................ ශ්‍රේණිය :- ........................................

උපදෙස්
- මෙම කොටසේ ප්‍රශ්න 40 ක් ඇත. සියලු ප්‍රශ්නවලට මෙම ප්‍රශ්න පත්‍රයේම පිළිතුරු සපයන්න.
- මෙම කොටසට ලකුණු 40 ක් හිමිවේ.

- අංක 01 සිට 10 තෙක් එක් එක් ප්‍රශ්නය සඳහා නම් පහ බැගින් දී ඇත. ඒවා අතුරින් එකක් කවර හෝ හේතුවක් නිසා අනෙක් නම් සමග නොගැලපේ. එම නොගැලපෙන නම කුමක්දැයි හඳුනාගෙන එහි අංකය වරහන තුළ ලියන්න.

01. (1) තේම්ස් (2) එල්බ් (3) පෝ (4) බර්ලින් (5) විස්ටියුලා (...........)

02. (1) ඇතන්ස් (2) තීබ්ස් (3) ඔලිම්පස්
(4) කොරින්ත් (5) මිලේටස් (...........)

03. (1) පයිතගරස් (2) ඊස්කිලස් (3) සොෆොක්ලීස්
(4) යුරිපීඩීස් (5) ඇරිස්ටෝෆර්නිස් (...........)

04. (1) ඩ්‍රැකෝ (2) සොලෝන් (3) ක්ලේයිස්තීනස්
(4) පෙරික්ලස් (5) ජස්ටිනියන් (...........)

05. (1) රාජාණ්ඩුව (2) කතිපයාධිපති ආණ්ඩුව (3) ප්‍රජා පීඩක පාලනය
(4) ප්‍රජාතන්ත්‍රවාදය (5) ප්‍රජක තන්ත්‍රය (...........)

06. (1) ඔස්ටර්ගොත්වරු (2) යුදෙව්වෝ (3) විසිගොත්වරු
(4) ලොම්බාඩිවරු (5) වැන්ඩල්වරු (...........)

07. (1) ජුපිටර් (2) සීයුස් (3) ඇපලෝ
(4) ඇතීනා (5) ඇෆ්‍රෝඩයිට් (...........)

08. (1) හිපොක්‍රටීස් (2) පැරසෙල්සස් (3) මයිකල් සර්වේටස්
(4) තෝමස් මුවර් (5) විලියම් හාවේ (...........)

09. (1) නිකලස් කොපර්නිකස් (2) ජෝන් හස් (3) ජෝන් ටෙට්සල්
(4) උල්රිච් ස්විංලි (5) ජෝන් කැල්වින් (...........)

10. (1) නිකලස් කොපර්නිකස් (2) වස්කෝද ගාමා (3) ගැලීලියෝ ගැලිලි
(4) ජොහැන්නස් කෙප්ලර් (5) අයිසැක් නිව්ටන් (...........)

- අංක 11 සිට 15 තෙක් ප්‍රශ්නවලට පද යුගල පහ බැගින් ද ඇත. ඉන් එක් යුගලයක් එකිනෙක නොගැලපේ. එම නොගැලපෙන යුගලය කුමක්දැයි හඳුනාගෙන ඊට අදාළ අංකය වරහන තුළ ලියන්න.

11. (1) හෝමර් - ඔඩිසි (2) සොෆොක්ලීස් - ඊඩිපස් (3) සොක්‍රටීස් - ඉලියඩ්
(4) ප්ලේටෝ - ජනරජය (5) තුසිඩිඩීස් - ඉතිහාසය (...........)

12. (1) රෝමය - ටයිබර් (2) ලන්ඩන් - තේම්ස් (3) ලිස්බන් - ටාගුස්
(4) පැරිස් - සෙන් (5) බර්ලින් - ඩැනියුබ් (...........)

13. (1) සියුස් - ඔලිම්පියා (2) ඇතීනා - ඇතන්ස් (3) ඇපලෝ - ඩෙල්ෆි
(4) ජුපිටර් - ස්පාර්ටා (5) ඇෆ්‍රොඩයිට් - කොරින්ත් (...........)

14. (1) යෝර්ක් - වෙනීසිය (2) ස්ෆෝර්සා - මිලාන් (3) මෙඩිචි - ෆ්ලෝරන්ස්
(4) එස්තේ - ෆෙරාරා (5) ගොන්සාගා - මැන්ටුවා (...........)

15. (1) බර්තොලමියු ඩයස් - කුනාටු තුඩුව
(2) නාවික හෙන්රි - නව ලෝකය
(3) ක්‍රිස්ටෝපර් කොලම්බස් - බටහිර ඉන්දීය කොදෙව් දූපත්
(4) වස්කෝදගාමා - ඉන්දියාව සොයා ගැනීම
(5) ෆර්ඩිනන්ඩ් මැගලන් - ලෝකය වටා යාත්‍රා කිරීම (...........)

- **අංක 16 සිට 20 තෙක් එක් එක් ප්‍රශ්නය සඳහා x සහ y තීරු යටතේ දක්වා ඇති තොරතුරු නොගැලපෙන අයුරින් දක්වා ඇත. x සහ y තීරුව අනුපිළිවෙළට ගැලපූ විට නිවැරදි පිළිතුර අයත් අංකය ලියන්න.**

| | x | | y |
|---|---|---|---|
| 16. | (I) ඩාඩනල්ස් සමුද්‍ර සන්ධිය | A | පැසිපික් සාගරය හා අත්ලාන්තික් සාගරය |
| | (II) ජිබ්‍රෝල්ටා සමුද්‍ර සන්ධිය | B | උතුරු මුහුද බෝල්ටික් මුහුද |
| | (III) සූවස් ඇල | C | අත්ලාන්තික් සාගරය හා මධ්‍යධරණී මුහුද |
| | (IV) පැනමා ඇල | D | ඊජියන් මුහුද මර්මරා මුහුද |
| | (V) කීල් ඇල | E | මධ්‍යධරණී මුහුද හා රතු මුහුද |

(1) D E C B A (2) D A B C E (3) D C E A B
(4) D B A E C (5) D E B A C (...........)

| | | | |
|---|---|---|---|
| 17. | (I) රොන් ගංගාව | A | කළු මුහුද |
| | (II) සෙන් ගංගාව | B | ඉංග්‍රීසි ඕඩය |
| | (III) ඩැනියුබ් ගංගාව | C | ආඩ්‍රියාතික් මුහුද |
| | (IV) විස්ටියුලා ගංගාව | D | මධ්‍යධරණී මුහුද |
| | (V) පෝ ගංගාව | E | බෝල්ටික් මුහුද |

(1) D E C B A (2) D C E A B (3) D A B C E
(4) D B A E C (5) D E B A C (...........)

| | | | |
|---|---|---|---|
| 18. | (I) පාර්තිනොන් | A | මොස්කව් |
| | (II) කොලොසියම් | B | පැරිස් |
| | (III) ශාන්ත පීටර් බැසිලිකාව | C | රෝමය |
| | (IV) ක්‍රෙම්ලින් | D | ඇතන්ස් |
| | (V) අයිෆල් කුළුන | E | වතිකානුව |

(1) D C E A B (2) C E A B D (3) D E A C B
(4) B E A C D (5) E D A C B (...........)

| | | | |
|---|---|---|---|
| 19. | (I) පොටගොරස් | A | මිනිසා දේශපාලන සත්වයෙකි. |
| | (II) සොක්‍රටීස් | B | සත්‍ය නීතිය යනු ස්වභාව ධර්මයයි. |
| | (III) හිපොක්‍රටීස් | C | සද්භාවය වූ කලී දැනුමයි. |
| | (IV) ඇරිස්ටෝටල් | D | සියලු දේ මනින මිම්ම මිනිසාය. |
| | (V) සිසරෝ | E | සෑම රෝගයකටම ස්වභාවික හේතුවක් ඇත. |

(1) C E A B D (2) D E A C B (3) B E A C D
(4) E D A C B (5) D C E A B (...........)

| | | | |
|---|---|---|---|
| 20. | (I) ටොලමි | A | ග්‍රහලෝක සූර්යා වටා ඉලිප්සාකාරව ගමන් කිරීම |
| | (II) කොපර්නිකස් | B | ගුරුත්වාකර්ශනය |
| | (III) කෙප්ලර් | C | දුරදක්නය නිපදවීම |
| | (IV) ගැලීලියෝ ගැලීලි | D | සූර්ය කේන්ද්‍රීය විශ්වය |
| | (V) අයිසැක් නිව්ටන් | E | පෘථිවි කේන්ද්‍රීය විශ්වය |

(1) D C E A B (2) E D A C B (3) C E A B D
(4) D E A C B (5) B E A C D (...........)

- අංක 21 සිට 25 තෙක් සෑම ප්‍රශ්නයකට ම එක් මාතෘකාවක් යටතේ කරුණු පහ බැගින් සපයා ඇත. එම කරුණු අතරින් එකක් අදාළ මාතෘකාවකට නොගැළපෙයි. එය තෝරා ඊට අදාළ අංකය ඉදිරියෙන් ඇති වරහන තුළ ලියන්න.

21. ග්‍රීක පෞරව රාජ්‍ය
   (1) ග්‍රීක පෞරව රාජ්‍ය පොලිස් නමින් හැඳින්වීය.
   (2) සියුස් දෙවියා දේව මණ්ඩලයේ ප්‍රධානියා විය.
   (3) ඔගස්ටස් සීසර් ග්‍රීසියේ සිටි පාලකයකු විය.
   (4) පෙරික්ලස් සමයේ දී ප්‍රජාතන්ත්‍රවාදය සම්පූර්ණ විය.
   (5) ස්පාටාව භූමියෙන් විශාලතම පෞරව රාජ්‍ය විය. (...........)

22. පහත සඳහන් කරුණු අතරින් වැඩවසම් යුගයේ ලක්ෂණයක් නොවන්නේ,
   (1) වැඩවසම් යුගයේ රජුගේ බලය ශක්තිමත් විය.
   (2) රජුට ස්ථිර හමුදාවක් නොවීය.
   (3) ප්‍රභල රදල පන්තියක් සිටීම
   (4) ප්‍රවේණි දාස ක්‍රමයක් පැවතීම
   (5) සමකාලීන ආගම ප්‍රභල තත්වයක පැවතීම (...........)

23. දේශ ගවේෂණය
   (1) ස්පාඤ්ඤය හා පෘතුගාලය දේශගවේෂණයේ පුරෝගාමීන් වීම
   (2) දේශගවේෂණයේ ප්‍රධාන අරමුණ වූයේ පෙරදිගට නව මාර්ගයක් සොයා ගැනීමයි.
   (3) වස්කෝදගාමා 1498 කැලිකට් වෙත ගොඩබැසීම
   (4) ෆර්ඩිනන්ඩ් මැගලන් බ්‍රසීලය සොයා ගැනීම
   (5) 1505 පෘතුගීසීන් ලංකාවට පැමිණීම (...........)

24. කිතු දහම
   (1) කිතු දහම ඒක දේවවාදයකි.
   (2) කි. ව. තුන්වන සියවස තෙක් රෝම පාලකයන් කිතුනුවන් වදහිංසා කිරීම
   (3) ක්‍රි. ව. තුන්වන සියවස පමණ වන විට කිතු දහම රෝමය පුරා ව්‍යාප්ත වීම
   (4) තියඩෝෂියස් අධිරාජ්‍ය කිතු දහම රෝම අධිරාජ්‍යයේ රාජ්‍ය ආගම බවට පත් කිරීම
   (5) ජස්ටිනියන් අධිරාජ්‍ය කිතුනුවන්ට වදහිංසා කිරීම නතර කිරීම (...........)

25. ආගමික ප්‍රතිසංස්කරණ
   (1) ආගමික ප්‍රතිසංස්කරණ ජර්මනියෙන් ආරම්භ විය.
   (2) ආගමික ප්‍රතිසංස්කරණ පුනරුදය ඇතිවීමට මග පෑදීය.
   (3) කතෝලික සභාව ආශ්‍රිතව පැවති දූෂණ ආගමික ප්‍රතිසංස්කරණ ඇතිවීමට තුඩුදුන් ප්‍රධාන හේතුවකි.
   (4) මාටින් ලූතර් ආගමික ප්‍රතිසංස්කරණයේ ආරම්භකයා විය.
   (5) 1517 දී කරුණු අනූ පහකින් යුත් ලියවිල්ලක් විටෙන්බර්ග් දේවස්ථානයේ දොරටුවේ ඇලවීම (...........)

- අංක 26 සිට 30 තකේ එක් එක් ප්‍රශ්නයට දක්වා ඇති A, B, C, D යන ප්‍රතිචාර හතර අතුරින් එකක් හෝ කිහිපයක් නිවැරදිය. නිවැරදි ප්‍රතිචාරය හෝ ප්‍රතිචාර තෝරා

| | | |
|---|---|---|
| A සහ B පමණක් නිවැරදි නම් | 1 | ද |
| A සහ C පමණක් නිවැරදි නම් | 2 | ද |
| B සහ C පමණක් නිවැරදි නම් | 3 | ද |
| C සහ D පමණක් නිවැරදි නම් | 4 | ද |
| වෙනත් ප්‍රතිචාර සංඛ්‍යාවක් නිවරුදි කර | 5 | ද  වරහන තුළ යොදන්න. |

**උපදෙස් සම්පිණ්ඩනය**

| 1 | 2 | 3 | 4 | 5 |
|---|---|---|---|---|
| A සහ B පමණක් නිවැරදි | A සහ C පමණක් නිවැරදි | B සහ C පමණක් නිවැරදි | C සහ D පමණක් නිවැරදි | වෙනත් ප්‍රතිචාර සංඛ්‍යාවක් නිවැරදි |

26. පහත දක්වෙන ආණ්ඩුක්‍රම අතරින් පුරාණ රෝමවරුන් අතර ප්‍රචලිතව පැවති ආණ්ඩු ක්‍රම කවරේද?
   A. කතිපයාධිති ආණ්ඩුව
   B. රාජාණ්ඩුව
   C. අධිරාජ්‍යවාදී ආණ්ඩුව
   D. ප්‍රජාපීඩක ආණ්ඩුව (...........)

27. පහත දක්වෙන්නත් අතුරින් පුරාණ ඇතන්ස් රාජ්‍යයේ පාලකයෝ කවුරුන්ද?
   A. ක්ලිස්තිනීස් B. පෙරික්ලස් C. ඩේරියස් D. ජූලියස් සීසර් (...........)

28. පහත දක්වෙන කරුණු අතරින් පුනරුදයේ අංග ලක්ෂණ කවරේද?
   A. මානවවාදය
   B. රෝම ගෘහ නිර්මාණ ශිල්පය ප්‍රතික්ෂේප කිරීම
   C. භෞතික දෘෂ්ටිය
   D. ගොතික් සම්ප්‍රදාය පුනර්ජීවනය (...........)

29. පහත ගෝත්‍ර අතරින් බටහිර රෝම අධිරාජ්‍යයට ආක්‍රමණ එල්ලකළ ම්ලේච්ඡ ගෝත්‍ර වන්නේ
A. ෆ්‍රීනීෂියන්වරු B. ලිඩියන්වරු C. විසිගොත්වරු D. ඔස්ට්‍රගොත්වරු (...........)

30. පහත දැක්වෙන්නන් අතරින් පුරාණ රෝම පාලකයන් කවුද?
A. ඔගස්ටස් සීසර් B. ජූලියස් සීසර් C. මාර්කස් අවුරේලියස් D. නීරෝ (...........)

- අංක 31 සිට 35 තෙක් ප්‍රශ්නවලට නිවැරදි පිළිතුරු තෝරා එහි අංකය වරහන් තුළ ලියන්න.

31. ඇලෙක්සැන්ඩර් අධිරාජ්‍යයේ ගුරුවරයා වූයේ කවර දාර්ශනිකයාද?
(1) සොක්‍රටීස් (2) ඇරිස්ටෝටල් (3) ප්ලේටෝ
(4) පයිතගරස් (5) හිපොක්‍රිටිස් (...........)

32. රෝමයේ පළමු අධිරාජ්‍යයා කවරෙක්ද?
(1) නීරෝ (2) ජස්ටීනියන් (3) ඔගස්ටස් සීසර්
(4) ජූලියස් සීසර් (5) ඩයිසිටියන් (...........)

33. පුනරුදය ආරම්භ වූ රට කුමක්ද?
(1) ඉතාලිය (2) ප්‍රංශය (3) එංගලන්තය (4) ජර්මනිය (5) ස්පාඤ්ඤය (...........)

34. කාර්මික විප්ලවයේ නව සොයා ගැනීමක් නොවන්නේ,
(1) ජලරාමුව (2) කටින ජෙනිය (3) වාෂ්ප එංජිම
(4) ආරක්ෂක ලාම්පුව (5) සුළං මෝල (...........)

35. පුනරුද සමයේ පහළ වූ අග්‍රගන්‍ය ප්‍රතිමා ශිල්පියා කවුද?
(1) රෆායල් (2) බොට්ටිචෙල්ලි (3) විලියම් හාවේ
(4) ලෙනාඩෝ ඩාවින්චි (5) මයිකල් ආංජිලෝ (...........)

- **අංක 36 සිට 40 තෙක් ප්‍රශ්නවලට අදාළව ප්‍රකාශ දෙක බැගින් දී ඇත. එක් එක් ප්‍රශ්නය සම්බන්ධයෙන් දී ඇති ප්‍රකාශ යුගලයට හොඳින්ම ගැලපෙනුයේ පහත වගුවෙහි දැක්වෙන 1, 2, 3, 4, 5 යන කවර ප්‍රකාශ යුගලයදැයි තෝරා ඊට අදාළව අංකය වරහන තුළ ලියන්න.**

| පළමු ප්‍රකාශය | දෙවැනි ප්‍රකාශය |
|---|---|
| (1) නිවැරදිය | වැරදිය |
| (2) නිවැරදිය | නිවැරදිය |
| (3) වැරදිය | වැරදිය |
| (4) වැරදිය | නිවැරදිය |
| (5) නිවැරදිය | නිවැරදි වන අතර පළමුවැන්න මැනවින් පහදා දෙයි. |

| පළමු ප්‍රකාශය | දෙවන ප්‍රකාශය |
|---|---|
| 36. පුරාණ ග්‍රීකයෝ විශ්වයේ වඩාත්ම වැදගත් සත්වයා ලෙස මනුෂ්‍යා උත්කර්ෂයට නැංවූහ. | ක්‍රි. පූ. අටවන සියවසේදී හෝමර් ලයිසියම් නම් පාසල ආරම්භ කරනු ලැබීය. (............) |
| 37. පයිතගරස් රෝමයේ සිටි ප්‍රසිද්ධ සාහිත්‍ය කරුවෙකි. | ම්ලේච්ඡ ආක්‍රමණ බටහිර රෝම අධිරාජ්‍ය බිඳවැටීමට හේතුවක් විය. (............) |
| 38. වැඩවසම් යුගය තුළදී දේශපාලන බලය විකේන්ද්‍රියව පැවතුනි. | වැඩවසම් සමාජය තුළ කතෝලික පල්ලිය බෙහෙවින් බල සම්පන්න විය. (............) |
| 39. පුනරුද යුගය තුළදී කලා අංශයේ සීඝ්‍ර දියුණුවක් ඇති විය. | පුනරුද යුගය තුළදී චිත්‍ර කලාව ප්‍රතිමා කලාව ඉතා දියුණුවට පත් අතර කලා කරුවන් තම පෞද්ගලිකත්වය ඉස්මතු කරමින් ලෞකිකත්වයට බර නිර්මාණ බිහි කරනු ලැබීය. (............) |
| 40. වෛද්‍ය පැරසල්සස් රුධිර සංසරණ පද්ධතිය සොයා ගැනීම | තෝමස් මුවර් ආගමික ප්‍රතිසංස්කරණ ව්‍යාපාරයේ ප්‍රධාන නායකයෙකු විය. (............) |